# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2168/7 - 2020 මාර්තු මස 26 වැනි බ්‍රහස්පතින්දා - 2020.03.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ 1 වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළෙඳ භාණ්ඩය සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ 11 වැනි තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2020 මාර්තු මස 27 වැනි දින සිට ආරම්භවන මාස 03ක් වූ කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

**මහින්ද රාජපක්ෂ,**
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 මාර්තු මස 26 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* |
|---|---|---|---|---|
| වෙළෙඳ භාණ්ඩය | | | | විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | |
| 1. | 07.01 | 0701.90 | අනෙකුත් - අර්තාපල් | කි. ග්‍රෑමයට රු. 25.00 |



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*